නිපුණතාව 1 : - තොරතුරු ලෝකයෙහි පරිගණකයේ ස්ථානය විමර්ශනය කරයි .

නිපුණතා මට්ටම 1.1 : - ජාතික සංවර්ධනයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දායකත්වය විමර්ශනය කරයි.

10 ශ්‍රේ ණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතෙහි 1 පාඩම- 7 පිටුවේ සිට 12 පිටුව දක්වා අධ්‍යයනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යනු කුමක්ද?
2) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යෙදවුම් දැකිය හැකි ක්ෂේත්‍ර 8 ක් ලියා දක්වන්න.
3) ඉ-රාජ්‍ය යනු කුමක්ද?
4) ඉ-රාජ්‍ය සේවා පිළිබඳව වරහන් තුළින් තෝරා පහත වගුව සම්පූර්ණ කරන්න.

(G2C ,G2G,G2B,G2E)

| සේවය | ඉ-රාජ්‍ය සේවා වර්ගය |
|---|---|
| බැංකු තොරතුරු | |
| ශ්‍රී ලංකා රේගු විස්තර | |
| නීති පද්ධති | |
| ගැසට් | |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | |
| රාජ්‍ය ආයතන නාමාවලිය | |
| රාජ්‍ය සේවක ණය පිළිබඳ විස්තර | |
| ශ්‍රීලංකා සිතියම | |

5) තොරතුරු තාක්ෂණය අධ්‍යාපනයට උදව් වන ආකාරය කරුණු 5 ක් ලියන්න .
6) පන්ති කාමරයේ දී තොරතුරු තාක්ෂණය භාවිතා කරන ආකාරය කරුණු පහකින් ලියන්න.
7) නිවසේ සිට අධ්‍යාපනය ලැබිය හැකි වෙබ් අඩවි 2 ක් ලියා දක්වන්න.
8) ඉගෙනුම් කළමනාකරණ පද්ධතියකින් ශිෂ්‍යයාට හා පාසල් කළමනාකාරිත්වයට ගත හැකි පහසුකම් වෙන්කර ලියා දක්වන්න.
9) දුරස්ථ අධ්‍යාපනය යනු කුමක්ද?
10) දුරස්ථ අධ්‍යාපනයේ ගති ලක්ෂණ 5 ක් ලියා දක්වන්න.